සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - I

**13 ශ්‍රේණිය**

**කාලය පැය 01 යි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා වූ ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ලියන්න.**

---

(01) ප්‍රාසාංගික කලා ගොන්නට අයත් වරණය වනුයේ,

(1) නර්තනය, ගීත නාටක, බැලේ, මුද්‍රා නාට්‍ය
(2) ගුවන්විදුලි නාට්‍ය, ටෙලි නාට්‍ය, බැලේ, ඔපෙරා
(3) මූර්ති, චිත්‍රපට, නාට්‍යය, ඔපෙරා
(4) සංගීතය, මුද්‍ර නාට්‍ය, බැලේ, සිනමාව.
(5) නාට්‍ය, ටෙලි නාට්‍ය, ගීත නාට්‍යය, චිත්‍ර (........)

(02) සුප්‍රසිද්ධ බැලේ නාට්‍යයකි.

(1) කරදිය (2) නලදමයන්ති (3) ඊඩිපස්
(4) නට්කැකර් (5) කාමන් (........)

(03) 'නෘත්‍ය නාටක' ලෙස හඳුන්වන්නේ,

(1) බැලේ ය. (2) මුද්‍රා නාටක ය. (3) ගීත නාටක ය.
(4) ඔපෙරා ය. (5) ලෝකධර්මී නාට්‍ය ය. (........)

(04) 'කැලෑමල්' ගීත නාටකයේ නිර්මාතෘවරයා වන්නේ,

(1) චිත්‍රසේන හා වජිරා ය. (2) එස්. පනීභාරතය. (3) ප්‍රේමකුමාර එපිටවෙල ය.
(4) ප්‍රේමසිරි කේමදාස ය. (5) මකුලොලුව ය. (........)

(05) 'නෘත්ත' යන්නෙහි අර්ථය වන්නේ,

(1) අර්ථ ප්‍රකාංශිත නර්තනයයි. (2) අර්ථ ප්‍රකාංශනයෙන් තොර නර්තනයයි.
(3) සතර අභිනය මගින් භාව ප්‍රකාශනයයි. (4) සමාරෝප ක්‍රියාවලියයි.
(5) චරිතයක් අනුකරණයයි. (........)

(06) 'නාට්‍යය යනු ලෝකයාගේ පැවැත්ම අනුකරණයයි." එසේ ප්‍රකාශ කරන ලද්දේ,

(1) භරතමුනිවරයා ය. (2) ධනංජය ය. (3) ඇලඩයිස් නිකොල් ය.
(4) ඇරිස්ටෝටල් ය. (5) බර්නාඩ් ෂෝ ය. (........)

(07) රෝම රඟ මඬලෙහි ප්‍රේක්ෂක මංඩපය හැඳින්වූයේ,

(1) ඔ(ර)කෝට්‍රාව (2) ස්කේන් ගොඩනැගිල්ල (3) කේවියා
(4) ස්කීනියා ෆ්‍රොන්ස් (5) ප්ලැටියා (........)

(08) 'ගලායන එළිය' යනාර්ථය දෙන පහන් විශේෂය වන්නේ,

(1) ධාරා පහන් ය. (2) යොමු පහන් ය. (3) ස්ට්‍රිප් පහන් ය.
(4) වර්ණ චක්‍රය යි. (5) අල්ට්‍රාවයලට් පහන ය. (........)

(09) නාට්‍යයක 'ප්‍රේක්ෂාව' මතු කරලීමේ කාර්යභාරය පැවරෙන්නේ,
(1) අධ්‍යක්ෂවරයාට ය. (2) වේදිකා පාලකයාට ය.
(3) ආලෝකකරණ ශිල්පියාට ය. (4) පසුතල නිර්මාණ ශිල්පියාට ය.
(5) අංගරචනා ශිල්පියාට ය. (........)

(10) සාත්ත්වික අභිනය පිළිබඳ නාට්‍ය ශාස්ත්‍රයේ දක්වා ඇති ආකාරයට,
(1) භාව 09 ක් දක්වයි. (2) භාව 08 ක් දක්වයි.
(3) ස්ථිර භාව 09 ක් දක්වයි. (4) මුහුණ මගින් ප්‍රකාශ කරන භාව 04 ක් දක්වයි.
(5) ස්ථිර භාව 06 ක් දක්වයි. (........)

(11) 'පුස්ත' ලෙස සංස්කෘත නාට්‍යයෙහි හඳුන්වන්නේ,
(1) නාට්‍යෝපකරණයකි. (2) චරිත නාටයකි
(3) වේදිකාව සඳහා භාවිතා කරන පර්යාය වචනයකි
(4) සාත්ත්වික භාව සඳහා භාවිතා කරයි. (5) ආංගික අභිනයේ ප්‍රභේද වෙයි. (........)

(12) ආංගික අභිනයේ ප්‍රභේද අතරට වැටෙන වරණය වන්නේ,
(1) ආංගික, සාත්වික, ආහාර්ය අභිනයන් ය. (2) චාරී, කරණ, ස්ථානක යන්ය.
(3) වේපථු, ස්වරභංග, ප්‍රලය ය. (4) ලෝකධර්මී, නාට්‍යධර්මී ය.
(5) පුස්ත, කරණ, හස්ත ය. (........)

(13) 'ස්ටැනිස්ලාව්ස්කි' ගේ රූපණ විධි ක්‍රමය හුන්වන්නේ,
(1) බාහිර හා අභ්‍යන්තර රූපණය (2) සමාරෝපය.
(3) Method Acting (4) Theatre of the Absurd
(5) විකාර රූපීය. (........)

(14) විවිධ භාෂණ ක්‍රම අඩංගු නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,
(1) ග්‍රීක නාට්‍යයි. (2) සංස්කෘත නාට්‍යයි. (3) මධ්‍යකාලීන යුරෝපීය නාට්‍යයි.
(4) ජපන් නාට්‍යයි. (5) කෝලම්වලයි. (........)

(15) ඇරිස්ටෝටල් නම් දාර්ශනිකයා විසුවා යැයි සැලකෙන්නේ,
(1) ක්‍රි. පූ. 2 වන සියවසේ ය. (2) ක්‍රි. පූ. 4 වන සියවසේ ය.
(3) ක්‍රි. පූ. 3 වන සියවසේ ය. (4) ක්‍රි. පූ. 5 වන සියවසේ ය.
(5) ක්‍රි. පූ. 6 වන සියවසේ ය. (........)

(16) 'ට්‍රැජඩි යනු උත්තුංග ක්‍රියාවක් අනුකරණයයි." ලෙස ප්‍රකාශ කළේ,
(1) යුරිපිඩීස් ය. (2) ඊස්කිලස් ය. (3) ඇරිස්ටොෆානිස් ය.
(4) ඇරිස්ටෝටල් ය. (5) තෙස්පිස් ය. (........)

(17) 'ප්‍රත්‍යාවර්තනය' යනුවෙන් ග්‍රීක නාට්‍ය කලාවේ හඳුන්වන්නේ,
(1) අනාවරණය වූ සිදුවීම් මාලාවට අනපේක්ෂිත ගැටලු මතුවීම.
(2) ගැටලු නිරාකරණය වී නාට්‍ය අවසානය. (3) භාව විශෝධනයයි.
(4) කූටප්‍රාප්තියයි. (5) කථා වින්‍යාසය පෙළගැස්වීමයි. (........)

(18) 'ක්‍රියාවෙන් තොරව ට්‍රැජඩියක් සම්පූර්ණ විය නොහැක' යනුවෙන් ප්‍රකාශ කළේ,
(1) ස්ටැනිස්ලාව්ස්කිය. (2) ඇරිස්ටෝටල්ය. (3) සොෆොක්ලීස් ය.
(4) ඇරිස්ටෝෆානිස් ය. (5) චෝල්ටර් මාරසිංහ ය. (........)

(19) අර්ථ ප්‍රකෘති අතර 'ප්‍රකරි' හි කාර්ය වන්නේ,
(1) කතාවේ ලුහුඬු සාරයයි. (2) කතාව පුරාවටම පවතී.
(3) එක් සිද්ධියකට පමණක් සීමා වී පවතී. (4) නාට්‍ය අවසානයයි.
(5) අරමුණු ඉටු කරගැනීම සඳහා අනේක පාත්‍රයින්ගේ ක්‍රියාකාරීත්වය. (........)

(20) සංස්කෘත නාට්‍යයෙහි එන ප්‍රධාන කතා වස්තුවෙහි අඩංගු අවස්ථවකි,
(1) බීජ (2) යත්ත (3) පතාක
(4) කාර්ය (5) ප්‍රවේශකය (........)

(21) මහාවංශය ගුරුකොට ගනිමින් නිර්මාණය කෙරුණු දේශපාලන නාට්‍යයකි.
(1) සුභ සහ යස (2) හස්තිකාන්ත මන්තරේ (3) මනමේ
(4) සිංහබාහු (5) රත්තරං (........)

(22) නාට්‍යමය ලක්ෂණයන්ගෙන් යුක්ත වූ බෞද්ධ පූජාකර්මයකි,
(1) සූනියම් යාගය (2) මිලින්ද ප්‍රශ්නය (3) ඇත් බන්ධනය
(4) මී බන්ධනය (5) මංගර සමයම (........)

(23) දේශීය ශාන්තිකර්ම අතුරෙන් යක් සහ දේව තොවිලයක් අංඩගු ශාන්ති කර්මයයි,
(1) කොහොඹා කංකාරිය හා සූනියම් යාගයයි. (2) ගම්මඩු හා සන්නියැකුමයි.
(3) පහන් මඩු හා කොහොඹා කංකාරියයි. (4) සූනියම් යාගය හා සන්නියැකුමයි.
(5) රටයැකුම හා සන්නියැකුමයි. (........)

(24) පත්තිනි දේවිය පුද ලබන ශාන්තිකර්මයකි.
(1) බලි (2) මඩු ශාන්ති කර්ම (3) කොහොඹා කංකාරිය
(4) සන්නියැකුම් යාගය (5) සූනියම් යාගය (........)

(25) කිරිමඩුවේ නාට්‍යමය අවස්ථා ලෙස,
(1) ඇත් බන්ධනය, මුරුතැන් තැබීම. (2) කුරුම්බර නැටීම, රාම යක්කම
(3) කුරුම්බර නැටීම, මුරුතැන් තැබීම. (4) මඩු පේකිරීම, තොට පේකිරීම.
(5) මංගර සමයම, අසුරු යක්කම (........)

(26) සොකරි නාට්‍යයේ ඇති ශාන්ති කර්ම ලක්ෂණ අතරට,
(1) නැවක් තැනීම අයත් වේ. (2) පැදුරු වියමන අයත් වේ.
(3) ගුරුන්වහන්සේ විසින් චරිත හඳුන්වාදීම අයත් වේ.
(4) පූජාර්ථ කවි ගායනා ඇතුළත් වේ. (5) නාට්‍ය ධර්මී රංග ශෛලිය අනුගමනය කරයි. (........)

(27) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ පැරණිතම නාඩගම ලෙස සැලකෙන්නේ,
(1) ඇහැළේපොල (2) ස්ථාක්ති (3) හරිශ්චන්ද්‍ර
(4) චිත්‍රසේන (5) බුවනෙකබාහු (........)

(28) පිලිප්පු සිංඤෝ විසින් 1824 දී නිර්මාණය කරන ලද නාඩගමකි.
(1) හරිශ්චන්ද්‍ර (2) ඇහැළේපොල (3) මාතලන්
(4) හෙලේනා (5) රජ තුන්කට්ටුව (........)

(29) රයිගම, මීගොඩ, පිටිගල, මිරිස්ස වැනි ප්‍රදේශයන් හි ප්‍රචලිත ජන නාටක විශේෂය වනුයේ,
(1) සොකරි (2) කෝලම් (3) පාස්කු
(4) නාඩගම් (5) නූර්ති (........)

(30) ශ්‍රී ලංකාවේ කතෝලික ජනවන්දනා නාට්‍ය විශේෂයක් ලෙස සැලකෙන්නේ,
(1) පාස්කු ය. (2) ටීටර් ය. (3) නාඩගම් ය.
(4) නූර්ති ය. (5) කෝලම් ය. (........)

(31) නූර්ති නාට්‍යයේ වාද්‍ය භාණ්ඩ ලෙස,
(1) තාලම්පට, ගැටබෙරය (2) හොරණෑව, දවුල (3) සර්පිනාව, ඩෝල්කිය
(4) මද්දල, මෘදංගය (5) සර්පිනාව, මද්දල (........)

(32) මහාචාර්ය ඊ. එෆ්. ඩී. ලුඩෝවයික් ගේ ඉංග්‍රීසි නාට්‍යයකි,
(1) Arms and the man (2) ලිලියොම් (LiLiyom) (3) The Proposal
(4) The Bear (5) The Anniversary (........)

(33) ශාකුංතලය නාට්‍ය නිර්මාණය සඳහා මූලාශ්‍ර ගනු ලැබුවේ,
(1) පද්මපුරාණය (2) රාමායනය (3) සද්ධර්මරත්නාවලිය
(4) චිත්‍රමෝර්වෂිය (5) නාගානන්දය (........)

(34) හස්තිකාන්ත මන්තරයේ නාට්‍ය රචකයා වන්නේ,
(1) මහාචාර්ය සුචරිත ගම්ලත් (2) මහාචාර්ය වෝල්ටර් මාරසිංහ
(3) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර (4) ආරියවංශ රණවීර
(5) තිස්ස කාරියවසම් (........)

(35) සංස්කෘත නාට්‍ය රඟදැක්වීම සඳහා යොදාගනු ලබන රංගපීඨ ආකෘතියකි,
(1) ත්‍රශ්‍ය (2) පින්තූර රාමු (3) ග්ලොබ්
(4) එරීනා (5) රෝම (........)

(36) 'රෙදිපිළි ආදිය සකස් කරන ලද පසුතල' සංස්කෘත නාට්‍යයේ හඳුන්වන්නේ,
(1) සන්ධිම (2) ව්‍යාජිම (3) වේෂ්ටික
(4) කරණ (5) පුස්ත (........)

(37) 'භාව විශෝධනය' යනුවෙන් අදහස් වන්නේ,
(1) තාරුණ්‍යය හා බිය නැති කිරීමයි. (2) රසභාව උද්දීපනයයි.
(3) තාරුණ්‍යය හා බිය ඇති කිරීමයි. (4) ඛේදාන්තයක ලක්ෂණයයි.
(5) ක්‍රියා විකාශනයයි. (........)

(38) වීදි නාට්‍යකලාවේ පුරෝගාමී නාට්‍යකරුවෙකි,
(1) ගුණසේන ගලප්පත්ති (2) සුගතපාල ද සිල්වා (3) ගාමිණී හත්තොට්ටුවේගම
(4) රංජිත් ධර්මකීර්ති (5) නන්දන අල්ගෙවත්ත (........)

(39) 'නරක හොඳ ලෙස පෙනී යාමෙන්
විපත ඉක්මන් වෙයි නොසිතූ ලෙස'
මෙම පාඨය අඩංගු නාට්‍ය නිර්මාණය,
(1) හස්තිකාන්ත මන්තරේ (2) ජූලියස් සීසර් (3) ඇන්ටිගනී
(4) ඔතෙලෝ (5) ශකුංතලා (........)

(40) 'කල්පනා ලෝකය' නම් ග්‍රන්ථය,
(1) මහාචාර්ය එදිරිවීර සරචන්ද්‍ර (2) සුගතපාල ද සිල්වා
(3) සුචරිත ගම්ලත් (4) රන්ජිත් ධර්මකීර්ති
(5) චන්ද්‍රසිරි පල්ලියගුරු (........)

(ල. 01 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න 02 ක බැගින් තෝරාගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

## A කොටස

01. (i) ප්‍රාසාංගික කලාවේ ප්‍රධාන ලක්ෂණ කවරේද? (ලකුණු 4)

(ii) නාට්‍ය කලාව සහ සෙසු ප්‍රාසාංගික කලා අතර මූලික වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iii) 'නාට්‍ය වනාහි සාමූහික කලා මාධ්‍යයකි.' පහදන්න. (ලකුණු 6)

02. (i) නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද? (ලකුණු 4)

(ii) නාට්‍ය ධර්මී රංග ශෛලිය සතර අභිනයෙන් ප්‍රකට වනයුරු පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iii) ඕනෑම නාට්‍යයක නාට්‍ය ධර්මී ලක්ෂණ දැකිය හැක. විමසන්න. (ලකුණු 6)

03. (i) ඓතිහාසික කථාවස්තුවක් මුල්කරගත් නාට්‍යයක් ලෙස සුභ සහ යස කැපී පෙනෙන්නේ කවර හේතූන් නිසාද? (ලකුණු 4)

(ii) 'සුභ සහ යස' නාට්‍යයේ දේශපාලන හා ආර්ථික විවරණ කවරේදැයි පහදන්න. (ලකුණු 5)

(iii) සමකාලීන නාට්‍යකරුවන් අතර සයිමන් නවගත්තේගම සුවිශේෂී වන්නේ ඇයිදැයි පහදන්න. (ලකුණු 6)

## B කොටස

04. (i) නූතන යථාර්ථවාදී නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමීන් කවුරුන්ද? (ලකුණු 4)

(ii) එයින් එක් නාට්‍යකරුවකුගේ නාට්‍යයක් නිදසුන් ලෙස ගෙන එමගින් ඉදිරිපත් කරන සමාජ යථාර්ථය විමසන්න. (ලකුණු 5)

(iii) රූකඩ ගෙදර නාට්‍යයේ නුවුරාගේ චරිතය පිළිබඳ විචාරාත්මකව අධ්‍යනය කරන්න. (ලකුණු 6)

05. (i) එංගලන්තයේ ජන වන්දනා නාට්‍ය බිහිවීමට තුඩුදුන් හේතු සාධක මොනවාද? (ලකුණු 4)

(ii) ජන වන්දනා නාට්‍යයේ ප්‍රභේද විස්තර කරන්න. (ලකුණු 5)

(iii) එම නාට්‍ය ප්‍රදර්ශනය කෙරුණු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 6)

06. (i) සම්ප්‍රදායයන් තුනට අයත් දේශීය ශාන්තිකර්ම 2 බැගින් නම් කරන්න. (ලකුණු 4)

(ii) ඉහතින් දැක්වූ එක් සම්ප්‍රදායක ශාන්තිකර්මයක දක්නට ලැබෙන නාට්‍යමය අන්තර් රංගාවස්ථා පෙන්වා දෙන්න. (ලකුණු 5)

(iii) ශාන්තිකර්ම පැවැත්වීමෙන් අපේක්ෂා කරන අරමුණු මොනවාද? (ලකුණු 6)